කර්මාන්ත හා සැපයුම් කළමනාකරණ
අමාත්‍යාංශය

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

පූර්ණ රජය සතු සමාගමකි

වා ර් ෂි ක වා ර් තා ව

2019/2020

ප්‍රධාන කාර්යාලය
561/3,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

දුරකතන : 011 - 2368738
ෆැක්ස් : 011 - 2058062
විද්‍යුත් තැපෑල : kgll@sltnet.lk
වෙබ්අඩවිය : www.kgraphite.lk

පතල් කාර්යාලය
කහටගහ පතල
මදුරාගොඩ,
දොඩන්ගස්ලන්ද.

දුරකතන : 037-2252015

අ න් ත ර් ග ත ය

හැඳින්වීම	01
සභාපතිතුමාගේ සමාලෝචනය	02
විගණන කමිටු වාර්තාව	04
ආයතනික දැක්ම, මෙහෙවර හා අරමුණු	05
සංවිධාන ව්‍යුහය	06
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	07
විශේෂ ගිණුම්කරණ තොරතුරු	11
වාර්ෂික ගිණුම්	12
රැස්වීම පිළිබඳ දැන්වීම	13
පෙරකලාසි ආකෘති පත්‍රය	14

හැඳින්වීම

කහටගහ මිනිරන් වැඩබිම

"කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්" සමාගම මඟින් කළමනාකරණය කරනු ලබන කහටගහ පතල පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කොළඹ අගනුවර සිට ආසන්න වශයෙන් කිලෝමීටර් 90ක් පමණ දුරින් වූ මදුරාගොඩ, දොඩන්ගස්ලන්ද ප්‍රදේශයෙහිය. කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන සම්පූර්ණයෙන් රජය සතු, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමිත වගකීම් සහිත සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලද එහි ප්‍රධාන කොටස් හිමිකරු වන්නේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාය. විධායක සභාපතිවරයා ප්‍රධානකොට ගත් අධ්‍යක්ෂ මණ්ඩලය, කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනයේ ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදකයා වන අතර ආයතනික ප්‍රතිපත්තිවල හරය උකහාගන්නේ එහි රේඛීය අමාත්‍යාංශයන් සහ මහා භාණ්ඩාගාරයෙනි.

රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මදුරාගොඩ දොඩම්ගස්ලන්ද ප්‍රදේශයේ පිහිටිකහටගහ පතල මුහුදු මට්ටමේ සිට මීටර් 25ක් උසින් කඳුකර පෙදෙසක,ආසන්න වශයෙන් අක්කර 102ක භූමි භාගයක පිහිටා තිබෙන අතර එම අක්කර 102න් අක්කර 76ක වූ පොල් වගාවද 'කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්' සමාගම මඟින් කළමනාකරණය කරනු ලබයි.
ශ්‍රී ලංකාවේ, බෝගල පතල සහ කහටගහ පතල යනුවෙන් නම්කර ඇති ප්‍රධාන පතල් දෙකකි. 1872 සිට මෙහෙයුම් කටයුතු සිදු කෙරුණු කහටගහ පතල, කහටගහ සහ කොලොන්ගහ යන පතල් දෙකෙහි එකතුවකි.1973 වර්ෂයේ රජය යටතට ගත් පසුව මෙම පතල් දෙක එකතුකොට එක් පතලක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

පතල් ආවාට දෙකක් මඟින් ප්‍රවේශ විය හැකි අඩි 2000 (මීටර් 610) ක ගැඹුරකින් යුක්ත කහටගහ පතල වූ කලි ශ්‍රී ලංකාවේ ගැඹුරුතම පතලයි. කහටගහ පතල් ආවාටය අඩි 1132 (මීටර් 345) ක් වන අතර කොලොන්ගහ අඩි 330 (මීටර් 101) මට්ටම දක්වා ගමන් කරයි. මෙම ආවාට වෙන වෙනම ස්ථාන දෙකකින් මිහිතුල දක්වා කැණීම් කර ඇත. පහළ ඇති පතල් ආවාටයේ ප්‍රවේශය වන්නේ අඩි 2000 (මීටර් 610) ක් දක්වා වූ වින්චි (winch) මාලාවයි. ප්‍රධාන විංචිය සහ අනෙකුත් විංචි මිහිතුල කම්කරුවන් අඩි 1132 සිට අඩි 2000 මට්ටම දක්වා විවිධ මට්ටම් වලට ගෙන යාමට යොදාගනු ලබයි. පතල, එහි පුළුල්ම ස්ථානයේදී මීටර් 500ක් තරම් දක්වා වූ දුරකට ව්‍යාප්ත වේ.

කහටගහ නිෂ්පාදනයන්හි අනන්‍ය බව

ඉහළ කාබන් ප්‍රතිශතයකින් යුත්, ස්වභාවික ස්ඵටික ඉල්ලම් මිනිරන් සපයන අනන්‍ය සැපයුම්කරු ශ්‍රී ලංකාව වන අතර විශේෂයෙන්ම, කහටගහ පතල 99%ට වැඩි කාබන් ප්‍රතිශතයක් සහිත සම්පූර්ණයෙන් ස්ඵටික බවට පත්වූ ස්වරූපයෙන් පවතින ඉහළ පිරිසිදුභාවයකින් යුත් ස්වභාවික ඉල්ලම් මිනිරන් කැණීමේ හැකියාවක් සහිතය. එය ඉදිකටු වැනි සිහින් තුඩැති කූරු, කුට්ටි සහ පතුරු වශයෙන් දැකගත හැකි අතර අඩු භාෂ්මිකතාවක් සහිත ඉහළ කාබන් ප්‍රතිශතයකින් යුත් ස්ඵටික ඉල්ලම් මිනිරන් වශයෙන් බහුලව පවතී. තවද, ලොව පිළිගත් අනන්‍ය නිෂ්පාදනයක් වශයෙන් ලෝක වෙළඳපොළෙහි කීර්තිනාමයක් තහවුරු කරගෙන තිබේ.

සභාපතිතුමාගේ සමාලෝචනය

+99% C ඉහළ සංශුද්ධතාවයකින් යුත් ස්වභාවික ස්ඵටිකරූපී නහර මිනිරන් ලොවට ලබා දීමේ හැරවුම් ක්‍රියාවලියෙන් පසු කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් (KGLL) හි 2019 - 2020 වාර්ෂික වාර්තාව සකස් කිරීම සඳහා මෙම පණිවිඩය නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි

2022.09.28 දින කර්මාන්ත අමාත්‍යාංශය යටතේ සභාපතිවරයා ලෙස වැඩ භාරගෙන 2019/2020 කාලසීමාව සඳහා සභාපතිවරයාගේ සමාලෝචනය ලෙස මම මෙම වාර්තාව ඉදිරිපත් කරමි. සමාගමේ කාර්ය සාධනය දෙස බලන විට සමාලෝචිත වර්ෂය සැලකිය යුතු ලෙස ධනාත්මක විය.

නිෂ්පාදනය

2019/20 සමාලෝචිත වර්ෂය තුළ, පතල තුල මිනිරන් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 573 ක් විය. මෙය පෙර වසරේ නිෂ්පාදනය වූ මෙට්‍රික් ටොන් 732 ට සාපේක්ෂව 21.7 % ක අඩුවීමක් විය. සේවකයින් සෑම විටම ඉලක්කය වටා නිෂ්පාදනය කිරීමට උත්සාහ කරන අතර ශ්‍රම පිරිවැයට අනුකූලව මාසික නිෂ්පාදනය වැඩි නොවීම නිසා එය වඩාත් සමාගම් ඵලදායී මට්ටමකට ගෙන ඒමට කළමනාකාරිත්වය සාමූහික ගිවිසුම සංශෝධනය කිරීමට සලකා බලමින් සිටී.

විකුණුම් සහ අලෙවිකරණය

සැකසූ මිනිරන් 413 M.T රුපියල් මිලියන 126.62 කට අපනයනය කරන ලදී. පෙර වසරේ ආදායම රුපියල් මිලියන 127.5 හා සසඳන විට වර්ෂය තුළ ආදායම රු.මි.1 කින් පමණ අඩු විය. අඩු ආදායම් සඳහා හේතු වූයේ, විශේෂයෙන් 97/99% C සඳහා ඉහළ ශ්‍රේණියේ සැකසූ මිනිරන් අපනයනය මන්දගාමී වීමයි.

මූල්‍ය තත්වය

සාමාන්‍යයෙන්, අපගේ බොහෝ පිරිවැය සංරචක ස්වභාවයෙන්ම ස්ථාවර වූ අතර කළමනාකරණය විසින් ලාභ වැඩි කර ගැනීම සඳහා වියදම් පාලනය කිරීමට උපරිම උත්සාහයක් ලබා දුන්නේය. කෙසේ වෙතත් සමාගම බදු පෙර වසර සඳහා වාර්තා කළේ රු. මිලියන 2.84 කි. මෙය පෙර වසරේ අලාභය රුපියල් මිලියන 2.93 හා සසඳන විටරු. මිලියන 1.33. ලාභයකි.

කෙසේ වෙතත් සමාගම බදු වලට පෙර වර්ෂය සඳහා රුපියල් මිලියන 9.78 ක ලාභයක් වාර්තා කර ඇත.මෙය පෙර වසරේ පාඩුව රුපියල් මිලියන 2.84 හා සසඳන විට, රු. මිලියන 12.62 කින් ලාභය වැඩිවීමකි.

මිහිතුල සංවර්ධනය

කෙසේනමුත්, අප අඩු මූල්‍ය යටතේ ක්‍රියාත්මක වුවත්. මිහිතුල සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරන ලබා දෙන ලදී.භූගත සංවර්ධනය සඳහා රුපියල් මිලියන 9.41 කට ආසන්න මුදලක් ආයෝජනය කර ඇත.

පොල් වගා කිරීම හා වතු සංවර්ධනය

අප දැනටමත් අක්කර 52 ක පොල් වගාවක් නැවත සිටුවා, වත්ත නඩත්තු කිරීම සඳහා නිත්‍ය සේවකයින් 8 දෙනෙකු ලබා දී යටිතල පහසුකම් සහ පොහොර යනාදිය ලබා දී පොල් වත්ත මනාව කළමනාකරණය කර ඇත. අන්තර් වතු ව්‍යාපෘතිය යටතේඅපනයන සංවර්ධන මණ්ඩලයේද සහයොගයෙන් ගම්මිරිස් සහ කෙසෙල් වගාව ආරම්භ කර ඇති අතර හොඳින් නඩත්තු කිරීම සිදුකරනු ලබයි.

කෙසේ වෙතත්, එම ඉඩමටනඩු පැවරීම හෙතුවෙන් කිසිදු පාර්ශවයකට පරිහරණය නොකරන ලෙස අධිකරණයේන් තහනම් නියෝගයක් පැනවීම හේතුවෙන් අක්කර **102**ක ඉඩම්ප්‍රමාණයෙන් අක්කර **50**ක් පමණ ප්‍රයෝජනයට ගැනීමට හැකියාවක් නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස එය කැලයක් බවට පත්ව ගම්වාසීන්ගේ ප්‍රයෝජනයට ගෙන තිබේ. තව දුරටත් හිටපු සේවකයින් කිහිප දෙනෙකු තවමත් බලහත්කාරයෙන් සේවක නිල නිවාසවල රැඳී සිටිති. යොවුන් සේනාංකය සහ සමෘද්ධි බැංකුව විසින් අක්කර **9** කට වැඩි ඉඩම් ප්‍රමාණයක් සමාගමට කිසිදු ප්‍රතිලාබයක් නොමැතිව පරිහරණය කරයි. තවද සමාගමට අයත් ඉඩමේ ඇතැම් කොටස් බලහත්කාරයෙන් අල්ලාගෙන අනවසරයෙන් නිවාස තනා පදිංචිව සිටිති.

සේවක සුභසාධනය සහ ගැටළු

සම්පත් සහ අභිප්‍රේරණය සමඟින් සේවකයින්ගේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා සහභාගීත්ව කළමනාකරණය මඟින් සේවක සබඳතා පවත්වා ගෙන යන ලදී. රැකියාවේ අවදානම් ස්වභාවය සහ පාරිසරික ස්වභාවය නිසා මිහිතුල කම්කරුවාගේ හැසිරීම මිහිපිට සේවකයාගේ හැසිරීමට වඩා වෙනස් ය.

සමාලෝචිත වර්ෂය තුළ කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගමවිසින් කුමන සාර්ථකත්වයක් අත්කර ගත්තද, එය මෙම සංවිධානයේ සියලුම සේවකයින්ගේ, විශේෂයෙන් මිහිතුල සේවකයින්ගේ උනන්දුව සහ කැපවීම නොමැතිව කළ නොහැක්කකි. සෑම විටම අවදානම්වලට නිරාවරණය වන බැවින් මිහිතුල සේවකයන්ගේ මෙම දායකත්වය සැමවිටම සිහිපත් කළ යුතු අතර අගය කළ යුතුය.

සම අධ්‍යක්ෂවරුන් ද සමාලෝචිත වර්ෂය තුළ සමාගමට අභිවෘද්ධිය ළඟා කර ගැනීම සඳහා ඔවුන්ගේ නොමඳ දායකත්වය සහ සහයෝගය නොකඩවා ලබා දුන්හ.

කර්මාන්ත අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය, කර්මාන්ත අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍යවරුන් සහ , ලේකම්වරයා සහ කර්මාන්ත අමාත්‍යාංශයේ සමස්ත කාර්ය මණ්ඩලය, කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගමවෙත සහය දුන් භාණ්ඩාගාර ලේකම් සහ කාර්ය මණ්ඩලය සහ විශේෂයෙන්ම කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගමහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ සියලුම සේවකයින්, අවසාන වශයෙන් කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගමහි විගණකවරුන් ලෙස කිසිදු පැකිලීමකින් තොරව මෙම වසරේද තම සේවය සතුටුදායක ලෙස ඉටුකළ කළ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණකාධිපති සහ කාර්ය මණ්ඩලයට අපගේ සංවිධානයේ ස්තුතිය පුදකර සිටිමු.

තුසිර මලව්වේ තන්ත්‍රී (L.L.B.)
නීතිඥ
සභාපති
කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්
2022 ඔක්තෝබර් 12

විගණන කමිටු වාර්තාව

විගණන කමිටුවේ කාර්යභාරය

විගණන කමිටුවේ කාර්යභාරය සහ යොමු නියමයන් වන්නේ මූල්ය වාර්තාකරණයේ ඉහල ප්‍රමාණය හා ගුණත්වය, අවධානම් කළමනාකරණය, ව්යවස්ථාපිත හා නීත්යානුකූල අවශ්යතාවයන්ට අනුකූල වීම, දිරිගැන්වීම හා ආරක්ෂා කිරීම, ශක්තිමත් අභ්යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාම සහ කළමනාකරණයට සුදුසු උපදෙස් සැපයීම මගින් ඔවුන්ගේ අධීක්ෂණ වගකීම් ඉටු කිරීමට සහාය වීමයි .

විගණන කමිටුවේ සංයුතිය

විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර මහා භාණ්ඩාගාරය විසින් නම් කරන ලද විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විසින් සභාපතිත්වය දරයි. අයතනයේ ලේකම්වරයා කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කරයි. විගණන කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

ආර්.එල්.වීරසේකර මහතා - සභාපති භාණ්ඩාගාර නියෝජිත:/අධ්‍යක්ෂක
උපුල් අබේසිරිවර්ධන මහතා - අධ්‍යක්ෂ / සාමාජික
එස්.එස්.කැටවලගෙදර මහතා - අධ්‍යක්ෂ /සාමාජික
නිලානි ජයසිරි මහත්මිය - නි.විගණකාධිපති දෙපාර්තමේන්තුව - නිරීක්ෂක
බී.කේ.එම්.ජේ. රොද්‍රිගෝ මහත්මිය - ප්‍රධාන අභ්‍යන්තර විගණක,කර්මාන්ත අමාත්‍යාංශය - නිරීක්ෂක

රැස්වීම් සහ පැමිණීම

කමිටු රැස්වීම ත්‍රෛමාසිකව කැඳවනු ලබන අතර **2020** මාර්තු **31** දිනෙන් අවසන් වූ වර්ෂය තුළ රැස්වීම් පවත්වා ඇත. ගණකාධිකාරීවරයා සහ කර්මාන්ත අමාත්‍යාංශයෙන් පත් කරන ලද විගණක ඇතුළු සමාගමේ කළමනාකාර නිලධාරීන්ට සහ අවශ්‍ය විටදී රැස්වීම්වලට සහභාගි වන ලෙස ආරාධනා කෙරේ.

ක්‍රියාකාරකම්

කෙටුම්පත් අවසන් ගිණුම්, බාහිර විගණන වාර්තා සහ අභ්‍යන්තර විගණන වාර්තාආදිය සමාලෝචනය හා සාකච්ඡා කිරීම විගණන කමිටුවේ කාර්යයභාරය වේ. මෙම වාර්තා විගණන කමිටුව විසින් විමර්ශනය කරන අතර නිර්දේශිත අතිරේක පාලන සහ අවදානම් අවම කිරීමේ උපක්‍රම ක්‍රියාත්මක කිරීම මගින් පවතින අභ්‍යන්තර පාලනය ශක්තිමත් කරන අතර වැරදි, වංචාවන් සහ සමාගම විසින් මුහුණ දෙන මූල්‍ය හා මෙහෙයුම් අවධානම් අවම කරීමට කටයුතු කරයි. මෙම සෑම කමිටු රැස්වීමකදීම අභ්‍යන්තර විගණන විමසුම් ගැඹුරින් සාකච්ඡා කරන අතර එහිදී ඉස්මතු වන ගැටලු අවමකර ගැනීම සඳහා කළමනාකරණයට උපදෙස් ලබාදීම සිදුවේ. මෙම සාකච්ඡා තුලින් මතුවන ඇතැම් කරුණු වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරනු ලැබේ.

2019/2020 අවසාන ගිණුම් වර්ෂය සම්බන්ධයෙන් බාහිර විගණකවරයා තත්වාගණනය කල විගණනමතයක් ඉදිරිපත් කර ඇති බව කමිටුව නිරීක්ෂණය කළේය

කමිටුව වෙනුවෙන්
කමිටු සභාපති
23.08.2022

දැක්ම

"ඉහළ කාබන් ප්‍රතිශතයකින් යුත්, ස්වාභාවික ස්ඵටික ඉල්ලම් මිනිරන් ලොවට සපයන අනන්‍ය සැපයුම්කරු වීම."

මෙහෙවර

"ස්වාභාවික මිනිරන් ඛණිජ සම්පත උපරිම ප්‍රයෝජනයට ගෙන, රටට විදේශ විනිමය උපයමින් හා සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ක්‍රියාකාරී කොටස්කරුවෙකු වීම."

අරමුණු

"මිනිරන් කැණීම, ශුද්ධ කිරීම, නිර්යාත කිරීම, මිනිරන් කර්මාන්තය ආශ්‍රීත නිෂ්පාදන ඇතුළු මිනිරන් කර්මාන්තය වැඩි දියුණු කිරීම හා එහි එකතු අගය උපරිම කිරීම. "

සංවිධාන ව්‍යුහය

විධායක සභාපතිවරයකු සහ අධ්‍යක්ෂ මණ්ඩල පිටුව5
යටතේ කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගම සංවිධානය වී තිබේ.

සමාගමේ මෙහෙයුම් ක්‍රියාකාරකම් පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ සංවිධානය කර තිබේ.

- ✓ කැණීම
- ✓ සැකසුම්
- ✓ යාන්ත්‍රික සහ විදුලි ඉංජිනේරු ශිල්පය
- ✓ අලෙවිකරණය
- ✓ පිරිස් අංශය
- ✓ පරිපාලනය
- ✓ මූල්‍ය කටයුතු සහ ගිණුම්කරණය
- ✓ සැපයීම් සහ ගබඩා අංශය
- ✓ සාමාන්‍ය සිවිල් ඉංජිනේරු අංශය
- ✓ ආරක්ෂක අංශය

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

2020 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මේ සමඟ ඉදිරිපත් කරනු ලැබේ. එහි අඩංගු මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පිළියෙල කොට ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

එහි විගණකවරුන්ගේ වාර්තාව **2022** ඔක්තෝම්බර් **19** වැනි දින අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කරන ලදී.

ප්‍රධාන කාර්යයන්

සමාගමේ ප්‍රධාන කාර්යයන් වන්නේ,

1. **1957** අංක **49** දරණ රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ පලකරන ලද ගැසට් නිවේදනය මඟින් පිහිටුවන ලද රාජ්‍ය පතල් කැණීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවේ කොලොන්ගහ - කහටගහ පතල් ප්‍රදේශයේ නම් කර ඇති ව්‍යාපාරය පවත්වාගෙන යාම.
2. එකී රාජ්‍ය පතල් කැණීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවේ කොලොන්ගහ - කහටගහ වශයෙන් නම් කර ඇති එම පාර්ශවයට අයත් කරගත් සහ පාර්ශවය විසින් පරිහරණය කරන ලද චංචල සහ නිශ්චල දේපල වල හිමිකම පවත්වාගැනීම.

මෙහෙයුම් සහ මූල්‍ය විශේෂතා සමාලෝචනය

ලාභ හෝ අලාභ ප්‍රකාශය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය ප්‍රකාශය,මුදල් ප්‍රවාහ ප්‍රකාශය,කොටස්වල වෙනස්වීම් ප්‍රකාශය සහ **2020** මාර්තු **31** දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වාර්ෂික වාර්තාවේ **9** පිටු වල සිට දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂවරුන්ගේ සහ විගණකවරුන්ගේ අදාළ වගකීම්

සමාගමේ තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ඉදිරිපත් කිරීමට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ වගකීම අධ්‍යක්ෂවරුන් සතු වේ.මෙමමූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනත, ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනතට අනුකූලව සකස් කර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී සමාගම විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ විස්තර සහ වසර තුළ සිදු කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ වෙනස්වීම් හේතුවෙන් එහි බලපෑම පිළිබඳව මූල්‍ය ප්‍රකාශයේ පිටු අංක **14** සිට **22** දක්වා අනාවරණය කර ඇත.

දේපල, පිරියත සහ උපකරණ

එක් එක් වර්ෂය තුල දේපල, පිරියත සහ උපකරණ වල සංචලනයන් මූල්‍ය ප්‍රකාශන වල 20 වන සටහනෙන් දැක්වේ

පිටුව7

ආයෝජන

සමාගම විසින්. සේවකයාගේ පාරිතෝෂික ගෙවීමෙ වගකීම ඉටු කිරීම සඳහා NSB ඉතිරි කිරීමේ ගිණුමේ රු .මී.12,28 මුදලක් ස්ථාවර තැන්පත්වක් ලෙස ආයෝජනය කර ඇත.

පරිත්‍යාග

ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුල, සමාගම විසින් පරිත්‍යාගයන් සිදු කර නොමැත.

අධ්‍යක්ෂවරුන් විශ්‍රාම ගැනීම

සංගමික ව්‍යවස්ථාවලිය වගන්තිවල 97 වැනි වගන්තිය අනුව, නීල් වත්තුහේවා, රුචිර එල් වීරසේකර, ජනිත් දිනුක් ෂෝක්මන්, ඩබ්ලිව් එන් පී දමිත් මෙවන්, සම්පත් එස් කැටවලගෙදර, කපිල බී ඒකනායක යන මහත්වරුන් වසරක් තුළ මණ්ඩලයට පත් කරන ලද අතර එතැන් සිට මෙය සිදු වේ. මෙය ඔවින්ගේ පලමු මහසබා රැස්වීම වේ .ඔවුන් දැන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්/අධ්‍යක්ෂවරුන් ලෙස තේරී පත්වීමට තමන් විසින්ම ඉදිරිපත් වෙති.

2020 මාර්තු 31 දිනට අධ්‍යක්ෂවරු

2020 මාර්තු 31 දිනට අධ්‍යක්ෂ තනතුරු හොබවන ලද අයවලුන්ගේ නම් පහත දැක්වෙන පරිදි වේ.

සම්පූර්ණ නම

මොහොමඩ් රෂික් මොහොමඩ් හම්ජාඩ් මහතා	- (13/03/2019 සිට 09/12/2019 දක්වා)
K.D.චිත්‍රපාල මහතා, අතිරේක ලේකම්, PE (ආවරණ රාජකාරි)	- (2019.12.17 සිට 2020.02.12 දක්වා)
නීල් වත්තුහේවා මහතා	- (2020/02/13 දින සිට ආරම්භ වේ)
එන්.පී.ඒ.ආර්.ජයවර්ධන මෙනවිය	-(2019.03.13 සිට 2019/04/04 දක්වා)
ජේ.රස්නායක මහතා	-(2019/04/15 දින සිට ආරම්භ වේ)
ඒ.ඩී.එල්.ජී.කලංසූරිය මහතා	- (16/01/01 සිට ආරම්භ වේ)/
ඉස්මයිල් මොහොමඩ් ජුනයිස් මහතා	- (2019.03.13)
උතුමාන්කඳු මුහම්මද් නිසාර් මහතා	- (2019.03.13)
බාලසූරිය මුදියන්සේලාගේ නන්ද විපුල	
බණ්ඩාර බාලසූරිය මහතා	- (2019.03.13)
චානක අරම්පත්ත මහතා	- (2019.03.13 සිට 2019/12/09)
A H M අලවි මහතා	- (2019.03.13 සිට 12/2019)
එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා	- (2020/02/28 සිට 18/06/2020 දක්වා)
මොහොමඩ් ෆුවාඩ් මුසම්මිල් මහතා	- (2020/02/28 දින සිට ආරම්භ වේ)
ඩබ්ලිව්.එන්.ආර්.පී.දමිත් මෙවන් මහතා	- (ආරම්භය/2020/2020) .
ජනිත් දිනුක් ෂොක්මන් මහතා	- (2020/02/28 දින සිට ආරම්භ වේ)
S.S.කටවලගෙදර මහතා	- 2020/02/28 දින සිට ආරම්භ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි ප්‍රකාශ කරයි:

(1) සමාගම නීති සහ රෙගුලාසිවලට පටහැනි කිසිදු ක්‍රියාකාරකමක නිරත වී නැත

(2) සියලුම සමාගම සම්බන්ධ කොන්ත්‍රාත්තුවල ද්‍රව්‍යාත්මක සම්බන්දතා සහ ඔවුන් ද්‍රව්‍යාත්මක වශයෙන් උනන්දුවදක්වන කාරණා සම්බන්ධයෙන් ඡන්දය දීමෙන් වැළකී සිටීම;

(3) කොටස්හිමියන්ට සාධාරණ ලෙස සැලකීම සහතික කිරීම සඳහා සමාගම සියලු උත්සාහයන් ගෙන

ඇත

(4) ව්‍යාපාරය අඛන්ඩව පවතිමින් අවශ්‍ය පරිදි උපකල්පන හෝ සුදුසුකම්වලට අනුබල දීම සමඟින් ඉදිරියට යන සහ ඔවුන් මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා පාලනයන් සහ අවදානම් කළමනාකරණය ආවරණය කරමින් අභ්‍යන්තර පාලනයන් පිළිබඳ සමාලෝචනයක් සිදු කර ඇති අතර, ඒවායේ සඵලතාවය සහ ඒවා සාර්ථක ලෙස පිළිපැදීම පිළිබඳ සාධාරණ සහතිකයක් ලබාගෙන ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ වේතනය

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්පූර්ණ වේතනය මූල්‍ය ප්‍රකාශන අංක **.13**සටහනේ දක්වා ඇත.

සමාගම සමඟ ගිවිසුම් සහ යෝජිත ගිවිසුම් සඳහා අධ්‍යක්ෂවරුන්ගෙසම්බන්දකම් පිටුව8

සමාගම සමඟ ගිවිසුම් සහ යෝජිත ගිවිසුම් සඳහා අධ්‍යක්ෂවරුන්ගෙසම්බන්දකම් මූල්‍ය ප්‍රකාශනවල අංක **06** හි සඳහන් වේ.

ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම හා විශ්වාසය අනුව, රජයට සහ සේවකයන්ට අදාල සියලු ව්‍යවස්ථාපිත ගෙවීම්, අද දින වන විට නිරවුල් කොට තිබීම හෝ සමාගමේ පොත් වලට ගෙන තිබීම පිළිබඳව අධ්‍යක්ෂවරු තෘප්තිමත්ය

අවිනිශ්චිත වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම්

2020 මාර්තු **31** වැනි දිනට ප්‍රාග්ධන වියදම් මත සිදු කරන ලද අවිනිශ්චිත වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම් මූල්‍ය සටහන **8** හි දක්වා ඇත.

ශේෂ පත්‍ර දිනෙන් පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසු සිදුවූ ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බැලූ අතර අවශ්‍ය විටදී, යෝග්‍ය ගැලපීම් සහ හෙලිදරව් කිරීම් කර ඇත.

පසු ශේෂ පත්‍ර සිදුවීම්

සමාගමටශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවූ,ගැලපීම් අවශ්‍ය වන කිසියම් ද්‍රව්‍යාත්මක බලපෑමක් ඇති කරන සැලකිය යුතු සිදුවීම් නොමැත.

අඛණ්ඩපැවැත්ම

ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව ඇති බව අධ්‍යක්ෂවරු විශ්වාස

කරති. ඒ අනුව මුල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අකණ්ඩපැවැත්මපදනම අනුගමනය කිරීම සුදුසු බව අධ්‍යක්ෂවරු සලකති.

විගණකවරුන්ගේ වාර්තාව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇත.

විගණකවරු

සමාගමේ විගණකවරයා ලෙස සමාලෝචිත වර්ෂය තුළ විගණකාධිපතිවරයා විගණකවරයා ලෙස කටයුතු කළේය. විගණකාධිපතිවරයා විසින් විගණකාධිපතිවරයා තහවුරු කර ඇත්තේ ඔහුට විගණකවරුන් හැර වෙනත් කිසිදු උනන්දුවක් හෝ සබඳතාවක් නොමැති බවයි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආචාර ධර්ම සංග්‍රහයට අනුව ඔවුන් ස්වාධීන බව තහවුරු කරයි.මූල්‍ය වර්ෂය සඳහා විගණකවරුන් වෙත ගෙවිය යුතු ගාස්තු මුල්‍ය ප්‍රකාශනවල සටහන 14 හි දක්වා ඇත.

මුදල් අමාත්‍යාංශයේ පී.ඊ.ඩී. චක්‍රලේඛ 01 ප්‍රකාර විගණකාධිපතිවරයා ඉදිරි වසර සඳහා පත් කිරීමට යෝජනා කර ඇති අතර ඔවුන් පත් කිරීමට සහ ඔවුන්ගේ වේතනය නියම කිරීමට අධ්‍යක්ෂවරුන්ට බලය පැවරීමට යෝජනාවක් වාර්ෂික මහා සභා රැස්වීමේදී යෝජනා කෙරේ.

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි අත්සන් තබන ලදී.

....

අධ්‍යක්ෂ එකවුන්ටින්ග් සිස්ටම් සෙක්ක්‍රටරියෙල් සේර්විස් (ප්‍රයි) ලිමිටඩ්./ලේකම්

විශේෂ ගිණුම්කරණ තොරතුරු

නිෂ්පාදනය

වසර	මෙ.ටො.
2008/9	877
2009/10	915
2010/11	771
2011/12	888
2012/13	1018
2013/14	848
2014/15	712
2015/16	771
2016/17	811
2017/18	750
2018/19	732
2019/20	573



විකුණුම්

වසර	මෙ.ටො.
2008/9	497
2009/10	295.2
2010/11	760.3
2011/12	850.3
2012/13	537.8
2013/14	793
2014/15	708.5
2015/16	558.6
2016/17	530
2017/18	537
2018/19	530
2019/20	413



ආදායම්

වසර	රු .මි .
2008/9	60.4
2009/10	21.1
2010/11	105
2011/12	128
2012/13	91.6
2013/14	143.6
2014/15	122.5
2015/16	109
2016/17	112.4
2017/18	123.4
2018/19	127.55
2019/20	126.62



දළ ලාභය

වසර	රු .මි .
2008/9	44.8
2009/10	13.1
2010/11	62.4
2011/12	74.9
2012/13	53.5
2013/14	91.36
2014/15	56.35
2015/16	44.08
2016/17	45.47
2017/18	57.19
2018/19	47.89
2019/20	55.76



බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය

වසර	රු .මි .
2008/9	37.3
2009/10	1.5
2010/11	37.7
2011/12	54.3
2012/13	16.4
2013/14	21.18
2014/15	-10.84
2015/16	2.39
2016/17	-2.5
2017/18	-2.9
2018/19	-1.6
2019/20	9.7



ශුද්ධ වත්කම්

වසර	රු .මි ..
2008/9	4.4
2009/10	137
2010/11	166
2011/12	214
2012/13	423.4
2013/14	367.5
2014/15	337
2015/16	336
2016/17	334
2017/18	329.7
2018/19	325.82
2019/20	330.59



කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

වාර්ෂික ගිණුම්
2019/20

2019 අප්‍රේල් 01 සිට 2020 මාර්තු 31 දක්වා

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්
ගිණුම්2019/2020

අන්තර්ගතය	පිටුව
ආයතනික තොරතුරු	**01**
විගණකවරුන්ගේ වාර්තාව	**02 - 09**
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	**10**
මූල්‍ය තත්ව ප්‍රකාශය	**11**
ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය	**12**
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	**13**
වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්	**14 - 21**
මූල්‍ය ප්‍රකාශන හෙලිදරව් කිරීම	**22**
ගිණුම් සඳහා සටහන්	**23 - 31**
ආදායම් බදු ගණනය කිරීම	**32 -34**

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

2019 මාර්තු 31 දිනට ආයතනික තොරතුරු

සමාගමේ නම
කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

නෛතික ස්වභාවය
මුදල් අමාත්‍යාංශය යටතේ ඇති සීමිත වගකීම් සහිත සමාගමකි.

කොටස් හිමිකම සහ අයිතිය
ශ්‍රී ලංකා රජය වෙනුවෙන් 100% ක් මහා භාණ්ඩාගාර ලේකම්ට හිමිවේ.

ලියාපදිංචි කාර්යාලය (ප්‍රධාන කාර්යාලය)
නො. 561/3, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.

පතල් කාර්යාලය
කහටගහ පතල්, මදුරාගොඩ, දොඩම්ගස්ලන්ද.

ප්‍රධාන කාර්යාලය			පතල් කාර්යාලය		
දුරකථන	:	011- 2368738	දුරකථන	:	037 2252015
ෆැක්ස්	:	011- 2058062	ෆැක්ස්	:	037 4931711
ඊ මේල්	:	kgll@sltnet.lk			
වෙබ් අඩවිය	:	www.kgraphite.lk			

ව්‍යවස්ථාපිත තත්වය
2007 අංක **07** දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සීමිත වගකීම් සහිත සමාගමකි.

සමාගම් ලියාපදිංචි අංකය
පී.බී. 1513

2020 මාර්තු 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය

මොහොමඩ් රාෆික් මොහොමඩ් හම්ජාඩ් මහතා -(**13**.03.2019 සිට **09/12/2019**)
කේ.ඩී.චිත්‍රපාල මහතා, අතිරේක ලේකම්, පී.ඊ.(වැඩ බලන) **- (2019.12.17 සිට 12/02/2020)**
නීල් වාත්තුහේවා මහතා -**(13/02/2020 සිට)**
එන්.පී.ඒ.ආර්.ජයවර්ධන මහත්මිය – (**13/03/2019 සිට 15/**/04**2019)**
ජේ.රත්නායක මහතා **(15/04/2019 සිට)**
ඒ.ඩී.එල්.ජී.කළංසූරිය මහතා **(16/01/2019 සිට)**
ඉස්මයිල් මොහොමඩ් ජුනයිස් මහතා **(13/03/2019 සිට 12/2019)**
උතුමන්කන්දු මොහොමඩ් නිසාර් මහතා – (13.03.2019 සිට **12/2019**)
බාලසූරිය මුදියන්සේලාගේ නන්ද විපුල බණ්ඩාර බාලසූරිය මහතා **- (13/03/2019**
වානක අරම්පත්ත මහතා - (**13/03/2019 සිට 09/12/2019)**
එ.එච්.එම්.අලවි මහතා - (**13/03/2019 සිට 12/2019)**
එල්.කේ.ජගත් ප්‍රියංකර **(28/02/2020 සිට 18/06/2020)**
මොහොමඩ් ෆවාර්ඩ් මුසම්මිල් මහතා **(28/02/2020 සිට)**
ඩබ්.එන්.ආර්.පී.දමිත් මෙවන් මහතා **(03/2020 සිට)**
ජනිත් දිනුක් ෂොක්මන් මහතා **(28/02/2020 සිට)**
එස්.එස්.කැටවලගෙදර මහතා **(28/02/2020 සිට)**

ලේකම්වරු
එකවුන්ටිං සිස්ටම්ස් ඇන්ඩ් සෙරිටේරියල් සර්විසස් **(ප්‍රයිවට්) ලිමිටඩ් නො. 02, කාසල් වීදිය, කොළඹ 04.**

විගණකවරු
ශ්‍රී ලංකා විගණකාධිපති

.බැංකුකරු
ලංකා බැංකුව, කොල්ලුපිටිය සහ රිදීගම ශාඛාව,
ජාතික ඉතිරිකිරීමේ බැංකුව රිදීගම

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ටීඒඕ/ඒ/කේජීඑල්එල්/එෆ්එස්/20/11

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2022 ජූනි 20 දින

සභාපති,
කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම

කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගමේ 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගමේ ("සමාගම") 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර ,සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණයේ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) කුඩා හා මධ්‍ය පරිමාණයේ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 17.19 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීව කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන්ව ඇති රු.5,407,392 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 55 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද එම ඇස්තමේන්තුගත දෝෂය ප්‍රමිතයේ 10.15 – 10.18 ඡේද ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල නිරූපනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2020 ජනවාරි මාසයේ ගණනය කළ මිනිරන් තොගයට ලුහුකම් ගැලපීම් කර 2020 මාර්තු 31 දිනට වූ තොගය හඳුනාගෙන තිබුණි. ඒ අනුව මෙට්‍රික් ටොන් 432.32 ක විකුණුම්, මෙට්‍රික් ටොන් 413 ක් ලෙස සටහන් කිරීම නිසා අවසාන මිනිරන් තොගය මෙට්‍රික් ටොන් 19.32 කින් වැඩිවී තිබුණි. ගණනය කිරීම් අනුව වැඩි වූ එම තොගයේ වටිනාකම රු.3,348,926 ක් වීම නිසා අවසන් තොගය එම ප්‍රමාණයෙන් වැඩිවී, නිෂ්පාදන පිරිවැය (කැණීම් පිරිවැය) එම ප්‍රමාණයෙන් අඩුවී තිබුණි.

(ඇ) 2017 වර්ෂයේ අපනයනය කළ මිනිරන් තොගය සඳහා මුදල් නිරවුල් කිරීමෙන් පසුව සිදුකළ පරීක්ෂණයකින් කාබන් ප්‍රතිශතය සියයට 97ත් 99 ත් අතර නොමැති බව තහවුරු වී ඇතිබව දන්වා එම විකුණුම් ප්‍රතික්ෂේප කර තිබුණි. එසේ වුවද දෙපාර්ශවය අතර සිදු කළ සාකච්ඡා අනුව එම ගනුදෙනුකරු එම විකුණුම් වෙනුවෙන් ඩොලර් 28,000 ක වට්ටමක් ඉල්ලා තිබූ අතර 2019/20 කාලපරිච්ඡේදයේ කළ අපනයන වටිනාකමින් එම ප්‍රමාණය අඩු කරගෙන ඉතිරි මුදල් ගෙවා තිබුණි. එසේ අඩුකරගත් ඩොලර් 28,000 ක (රු.5,003,751) මුදල පාඩුවක් සේ සලකා ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයේ විකුණුම්වලට ගැලපීම් කිරීම නිසා වර්ෂයේ විකුණුම් එම ප්‍රමාණයෙන් අඩුවී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ හිඟ විදුලි බිල්පත් ශේෂ මත අයකළ රු.208,926 ක පොළිය, නිෂ්පාදන පිරිවැය (මිනිරන් කැණීම් පිරිවැය) ගණනය කිරීමේදී ඇතුළත් කර තිබීම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය පොලියේ ප්‍රමාණයෙන් වැඩිවී තිබුණි.

(ඉ) 2003 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ සේවයට බැඳුණු සේවකයින් 08 දෙනෙකුට අදාළව එකතුව රු.1,331,000 ක පාරිතෝෂික වෙන් කිරීම් සිදුකර නොතිබුණි. ඒ අනුව පාරිතෝෂික වෙන් කිරීම් ගිණුමේ ශේෂය අඩුවෙන්ද සමුච්චිත ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණයේ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද

பக்கம் 33 இன் 4

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍ර[illegible] ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යූහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2007 අංක 07 දරණ සමාගම් පනතේ 163 (2) (ඇ) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරණ සමාගම් පනතේ අංක 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගම ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/විධිවිධානවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2018 දෙසැම්බර් 07 දිනැති අංක. 03/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 1 හි අනු අංක 4	සමාගම 2016/17 සහ 2017/18 වර්ෂයන්ෙ රු.1,418,945 සහ රු4,399,723 ක අලාභයක් ලබා ඇති බැවින් 2018/2019 වර්ෂයට එක් අයෙකුට ගෙවිය හැකි ප්‍රසාද දීමනාව රු.3000 ක් වුවත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ගෙන එක් අයෙකුට රු.13,500 ක් බැගින් රු.1,413,250 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් කර තිබුණි. ඒ අනුව චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව රු.996,250 ක් වැඩිපුර ගෙවා තිබුණි.
(ආ) 2013 සැප්තැම්බර් 11 දිනැති අංක. 02/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික ප්‍රතිපාදන වෙන්කිරීම රු.3,796,539 ක් විය. එම ප්‍රතිපාදනයට අනුරූපීව වර්ෂය තුල එකතුව රු.3,111,871 ක් ශුද්ධ වශයෙන් ආයෝජනය කර ඇතත් චක්‍රලේඛ ප්‍රතිපාදනවලට පටහැනිව ඉන් සේවක වැටුප් ගෙවීම් වෙනුවෙන් රු.3,287,797ක මුදලක් ලබාගෙන තිබුණි.
(ඇ) 2003 ජූනි 02 දිනැති අංක. පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 වගන්තිය	වත්කම්, ඉන්වෙන්ට්‍රි හා තොග ලේඛණගත භාණ්ඩ පිළිබඳව වාර්ෂිකව සමීක්ෂණය කර නොතිබුණි.
(ඈ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වන වගන්තිය	පනත ක්‍රියාත්මක වන දින සිට වසර දෙකක් නොඉක්මවන කාලසීමාවක් ඇතුළත අස්ථිත්වයේ පාලක මණ්ඩලය විසින් අභ්‍යන්තර විගණකවරයෙකු පත් කළ යුතු වුවත් විගණනය දිනය වූ 2022 මාර්තු මස වන විටත් අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණි.
(ඉ) 2018 ජූලි 18 දිනැති කළමණාකරන චක්‍රලේඛයේ අංක. 03/2018 හි 1(ii) ඡේදය	අවම නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 65 ක් වූ විට මිහිතුළ හා නඩත්තු අංශයේ සේවකයන්ට දෛනිකව රු. 300 ක දීමනාවක්ද ද, සැකසුම් අංශයේ හා කාර්යාලයේ කාර්ය මණ්ඩලයට පිළිවෙලින් දීමනාවෙන් සියයට 50 ක් හා සියයට 40 ක් වශයෙන් දිරිදීමනාවක් ගෙවා තිබුණද ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඊ)	2007 ඔක්තෝබර් 04 දිනැති අංක. DMS/11P/C9 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය	(i) සමාගමට අනුමත කළ නිලධාරීන් 79 දෙනෙක බඳවාගත යුත්තේ මාස 06 ක කොන්‍ත්‍රාත් යටත්ව වන අතර ලාභදායීත්වය මත කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට සලකා බැලිය යුතුබව දක්වා තිබුණි. එසේ වුවද ඊට පටහැනිව 2014 නොවැම්බර් 12 දිනැති රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 25/2014 දරන චක්‍රලේඛය සමාගම් සම්බන්ධයෙන් අදාළ නොවූවද එම චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ සේවකයින් 59 ක් ස්ථීර කර තිබුණි.
		(ii) කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සඳහා වූ බඳවාගැනීමේ පරිපාටිය අනුමත කරගෙන නොතිබූ අතර , සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආයතනය සඳහා අනුමත ස්ථීර කාර්යය මණ්ඩලයක් නොවූවද, තත්‍ය කාර්යය මණ්ඩලය 195 ක් වී තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

  (අ) අවසාන නිෂ්පාදනයේ අගය වැඩිකිරීම සහ තරහකාරී වෙළඳපොලක් ලබාගැනීම මගින් ලාභය වැඩිකරගැනීම වෙනුවෙන් වැඩපිළිවෙලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සකස් කර නොතිබූ අතර 2018, 2019 වර්ෂයන් තුළදී පිළිවෙලින් මෙ.ටො. 834 හා මෙ.ටො. 925 ක් වශයෙන් අඩු කාබන් ප්‍රතිශතයක් සහිත අලෙවිකළ නොහැකි මිනිරන් තොගවල වර්ධනයක් සිදුව තිබුණි.

  (ආ) ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ පොල් ඵලදාව පිළිවෙලින් ගෙඩි 10,360 ක් සහ ගෙඩි 6,276 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඵලදාව සියයට 39 කින් අඩුවී තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී පොල් වත්තේ සේවකයින් වෙනුවෙන් රු.2,422,950 ක වියදමක් දරා තිබුණු අතර ඉන් ලද ආදායම රු.241,955 ක් පමණ වී තිබුණි. ඒ අනුව පොල් ඵලදාව සඳහා දරනු ලබන වියදමට සාපේක්ෂව ඵලදාව හා ආදායම ප්‍රමාණවත් වී නොතිබුණි.

3. **අනෙකුත් විගණන නිරීක්ෂණ**

(අ) ඉකුත් වර්ෂයේ සිටි විදේශීය ගැනුම්කරුවන් 4 දෙනා සමාලෝචිත වර්ෂය වන විට ගැනුම්කරුවන් 2 ක් දක්වා අඩුවී තිබුණි. එම ගැනුම්කරුවන්ගෙන් එක් සමාගමක් ඉකුත් වර්ෂයේ සියයට 57 ක් හා සමාලෝචිත වර්ෂයේ සියයට 46 ක් වශයෙන් මුළු විකුණුම්වලින් වැඩිම කොටසක් ගන්නා තනි ගැනුම්කරුවකු වීම, ගැනුම්කරුවන්ගෙන් ලැබෙන ඇණවුම් ප්‍රමාණයේ අඩුවක් නිරීක්ෂණය වීම, අපනයනය කරන තොගවල තත්ත්වය තෙවන පාර්ශවයකින් නිසි පරිදි සහතික කර නොතිබීම නිසා මිනිරන් සැපයීමේ වෙළඳපොළ පුළුල් කර ගැනීම මගින් විදේශ විනිමය ආදායම වැඩිකරගැනීම කෙරෙහි සමාගමේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) මිනිරන් මිල සියයට 10 කින් වැඩි කිරීමට 2019 වර්ෂයේ රැස්වූ මිල කමිටුවේදී තීරණය කර තිබුණි. එසේ වුවද එක් විදේශීය සමාගමකට අදාළව 2018 වර්ෂයේ කළ ඇණවුම්වල ඉතිරි ප්‍රමාණය සැපයීමට නියමිත වුවද, ඇණවුම ලබන අවස්ථාවේදී මිල පිළිබඳ එකඟතාවකට පත්වී නොතිබියදී සියයට 10 යේ මිල වැඩි කිරීමට එම සමාගම එකඟ වී නොතිබූ බැවින් එම සමාගමට අදාළව සියයට 5 කින් මිල වැඩිකර තිබුණි.

(ඇ) 2019/20 ගිණුම් වර්ෂයේදී සමාගමේ ක්‍රියාකාරී සැලැස්මට අනුව නිෂ්පාදනය මෙ.ටො. 609 ත් 622 ත් අතර ප්‍රමාණයකින් වැඩි කිරීමට ඇස්තමේන්තු කර තිබුණද, සත්‍ය නිෂ්පාදනය මෙ.ටො. 572.87 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයේ මෙ.ටො. 732 ක නිෂ්පාදනයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදනය මෙ.ටො. 159 කින් අඩු වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා	සටහන්	2019/2020 රුපියල්	2018/2019 රුපියල්
ආදායම			
මිනිරන් විකුණුම්	10	126,622,732	127,558,406
සෘජු පිරිවැය, කැණීම් පිරිවැය	11	(70,855,853)	(78,948,116)
දල ලාභය/අලාභය		55,766,879	48,610,290
වෙනත් ආදායම්	12	(2,006,480)	(1,608,215)
අඩුකලා: මෙහෙයුම් පිරිවැය			
කාර්යය මණ්ඩල පිරිවැය	13	(21,913,227)	(23,372,200)
ආයතන හා පරිපාලන පිරිවැය	14	(8,260,398)	(8,244,612)
නඩත්තු පිරිවැය	15	(968,821)	(580,188)
උපයෝගී පිරිවැය	16	(491,469)	(593,039)
ක්ෂය පිරිවැය	17	(5,823,917)	(5,950,869)
විදේශ විනිමය ලාභ / අලාභ		(269,964)	1,364,503
නිශ්චිත දායකත්ව සැලැස්ම - පාරිතෝෂික		(3,796,539)	(2,510,595)
පරිපාලන පිරිවැය		(41,524,336)	(39,887,001)
විකිණීමේ හා බෙදාහැරීමේ පිරිවැය	18	(1,381,626)	(1,433,812)
වෙනත් වියදම්	19	(1,064,606)	(8,530,617)
මෙහෙයුම් ලාභය / අලාභය		9,789,832	(2,849,355)
අඩුකිරීම්		-	-
බදු පෙර ලාභය / අලාභය		9,789,832	(2,849,355)
බදුකරණය		(3,927,737)	(2,154,393)
විලම්භිත බදු වියදම්		(10,155)	48,124
බදු පසු ලාභය / අලාභය		5,851,941	(4,955,624)
වෙනත් විස්තීර්ණ ආදායම්			
වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් / වියදම්		-	-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම් / වියදම්		5,851,941	(4,955,624)

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

මාර්තු 31 දිනට	සටහන්	2019/2020 රුපියල්	2018/2019 රුපියල්
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	20	165,613,149	178,112,451
මෙහෙයුම් නොවන වත්කම්	21	3,541,760	3,541,760
පොල් වගාව සංවර්ධනය		1,694,235	1,694,235
පාරිතෝෂික අරමුදල් ආයෝජන ගිණුම		12,288,004	12,822,661
විලම්භිත බදුවත්කම්		194,349	204,504
		183,331,498	196,375,611
ජංගම වත්කම්			
තොගය	22	185,345,590	162,939,431
ණයගැතියෝ, කැන්පතු සහ ලැබියයුතු දෑ	23	14,147,604	13,010,803
මුදල් හා මුදල් සමාන දෑ	24	4,768,494	841,754
		204,261,688	176,791,988
මුළු වත්කම්		387,593,187	373,167,599
ස්කන්ධ හා බැරකම්			
ප්‍රාග්ධන හා සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	25	13,000,000	13,000,000
රඳවාගත් ඉපැයීම්		317,599,855	311,747,914
		330,599,855	324,747,914
දිගුකාලීන බැරකම්			
පාරිතෝෂික ප්‍රතිපාදන	27	20,440,407	17,297,407
NSB		3,010,566	5,655,979
		23,450,973	22,953,386
ජංගම බැරකම්			
		2,645,414	2,324,550
වෙළඳ හා අනෙකුත් ණයහිමියෝ	28	4,864,574	4,044,385
බදු සඳහා ප්‍රතිපාදන	29	7,525,638	3,605,439
උපචිත වියදම්	30	18,506,734	15,491,92
		33,542,359	25,466,29
මුළු ස්කන්ධය හා බැරකම්		387,593,187	373,167,59

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි පිළියෙල කර ඇති බව මම සහතික කරමි.

ආර්.එම්.සී.පී.රාජපක්ෂ
කළමණාකරු

ඒ.සී.ඩබ්.ඩබ්.එම්.ආර්.කොස්වත්ත

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිවයුතු වන අතර අනුමත කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදි.

නීල් වාත්තුහේවා
සභාපති

ඒ.ඩී.එල්.ජී.කේ.කළංසූරිය
අධ්‍යක්ෂ

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

	කොටස් ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණන සංචිත	සමුච්චිත ලාභය /(අලාභය)	එකතුව
	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්
2018 අප්‍රේල් 01 දිනට ශේෂය	**13,000,000**	**-**	**316,703,538**	**329,703,538**
රඳවාගත් ඉපැයීම් වලට මාරු කිරීම-		-	-	-
පෙර වර්ෂයේ ගැලපුම්	-	-	-	-
වර්ෂය සඳහා ලාභය / (අලාභය)	-	-	**(3,881,427)**	**(3,881,427)**
2019 මාර්තු 31 දිනට ශේෂය	**13,000,000**	**-**	**312,822,111**	**325,822,111**
2019 අප්‍රේල් 01 දිනට ශේෂය	**13,000,000**	**-**	**312,822,111**	**325,822,111**
පෙර වසරේ ගැලපීම් සටහන් **01**			**(1,074,197)**	**(1,074,197)**
වර්ෂය සඳහා ලාභය / (අලාභය)	-	-	**5,851,941**	**5,851,941**
2020 මාර්තු 31 දිනට ශේෂය	**13,000,000**	**-**	**317,599,855**	**330,599,855**

සටහන් 01 පෙර වසරේ ගැලපීම්

ආරක්ෂක ගාස්තු ආපසු හැරවීම වෙනත් ආදායමක් ලෙස සටහන් කිරීම

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා	2019/2020 රුපියල්	2018/2019 රුපියල්
මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහ/(භාවිතා කිරීමෙන්)		
ආදායම් බදු වියදම් වලට පෙර ශුද්ධ ලාභය /(අලාභය)	9,789,832	(2,849,355)
ගැලපීම් :		
පාරිතෝෂික ප්‍රතිපාදන	3,796,539	2,510,595
පෙර වර්ෂය සඳහා ගැලපීම		
ස්පෘශ්‍ය ස්ථාවර වත්කම් මත ක්ෂය	21,915,171	21,113,966
මෙහෙයුම් නොවන වත්කම් අගයඅඩුවීම	-	-
විදේශ විනිමය අලාභ	(269,964)	1,364,503
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය	35,231,578	22,139,709
තොග (වැඩිවීම්)/ අඩුවීම්	(22,406,159)	(25,904,008)
ලැබිය යුතු දෑ (වැඩිවීම්)/අඩුවීම්	(1,136,801)	(507,911)
ණයහිමියන්ගේ (වැඩිවීම්)/අඩුවීම්	820,189	2,447,338
උපචිත වියදම් (වැඩිවීම්)/අඩුවීම්	3,014,809	4,968,733
මෙහෙයුම් කටයුතු වලින්/(කටයුතු වල යෙදීමෙන්) ලද ශුද්ධ මුදල් ප්‍රවාහ	15,523,615	3,143,862
ආයෝජන කටයුතු වලින්/(කටයුතු වල යෙදීමෙන්) ලද මුදල් ප්‍රවාහ		
ස්පෘශ්‍ය ස්ථාවර වත්කම් මිලට ගැනීම	(9,415,869)	(7,978,450)
පාරිතෝෂික අරමුදල් ආයෝජන	534,656	(6,235,022)
ආයෝජන කටයුතු වලින්/(කටයුතු වල යෙදීමෙන්)ලද ශුද්ධ මුදල් ප්‍රවාහ	(8,881,212)	(14,213,472)
මූල්‍ය කටයුතු වලින්/(කටයුතු වල යෙදීමෙන්) ලද මුදල් ප්‍රවාහ		
ආදායම් බදුගෙවීම්	(7,538)	(3,000,000)
NSB ණය ගිණුම- වායු විමෝචකය ගැනීම	(2,324,549)	7,980,529
පාරිතෝෂික ගෙවීම්	(653,540)	(112,854)
		-
මූල්‍ය කටයුතු වලින්/(කටයුතු වල යෙදීමෙන්) ලද ශුද්ධ මුදල් ප්‍රවාහ	(2,985,627)	(4,867,675)
මුදල් හා මුදල් සමාන විදේශ මුදල් හුවමාරු කිරීමේ බලපෑම	269,964	(1,364,503)
මුදල් හා මුදල් සමාන දේවල් වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	3,926,740	(7,566,437)
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දේ	841,754	8,408,191
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දේ	4,768,494	841,754
මුදල් හා මුදල් සමාන දෑ		
ලංකා බැංකුව - රිදීගම	3,421,459	236,598
ලංකා බැංකුව - කොල්ලුපිටිය	33,477	502,096
වාසික විදේශ ව්‍යවහාර ඩොලර් ගිණුම - ලංකා බැංකුව, කොල්ලුපිටිය	1,303,017	72,182
සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය	3,032	9,074
සුළු මුදල් - පතල් කාර්යාලය	7,509	21,804
	4,768,494	841,754

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. ආයතනික තොරතුරු

1.1 සාමාන්‍ය

කහටගහ ග්‍රැෆයිට්ලංකාලිමිටඩ්යනු, 1996 අංක 29 දරණ රාජ්‍ය ව්‍යවසායන්පුනරුත්ථාපනයකිරීමේපනතයටතේවර්ෂ 1997 දීරජයටනැවතපවරනුලැබුවාවුද, මීටඉහතදී'ජනතාකරණය' කරතිබුණාවූදසමාගමකි. දැනටඑයසම්පූර්ණයෙන්මරජයසතු ව්‍යාපාරයක් වන අතර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද ආයතනයක්වශයෙන්ක්‍රියාත්මකවෙමින්පවතියි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 561/3, ඇල්විටිගල මාවත නාරාහේන්පිට, කොළඹ 05හි පිහිටා ඇත.

1.2 ප්‍රධාන කාර්යයන් සහ කාර්යයන් වල ස්වභාවය

කාලපරිච්ඡේදය තුල මිනිරන් නිෂ්පාදනය සහ අපනයනය කිරීම සමාගමේ ප්‍රධාන කාර්යය විය.

1.3 අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

1.4 සංසන්දනාත්මක සටහන්

පෙර වර්ෂයන්ගේ පැවති සටහන් හා වාක්‍යයන් ප්‍රවර්තන වර්ෂයට අනුකූල වන පරිදි නැවත සකස්කොට ඉදිරිපත්කර ඇත.

2 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

2.1 පිළියෙල කිරීමේ පදනම

විශේෂයෙන් දක්වා ඇති දෑ හැර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත. විශේෂයෙන් දක්වා ඇති දෑ හැර මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත්කර ඇත.

2.2 අනුකූලතා ප්‍රකාශනය

ආයතනයේ මූල්‍ය ප්‍රකාශනශ්‍රීලංකාවරලත්ගණකාධිකාරීආයතනයමඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ගිණුම්කරණප්‍රමිතින් වන එස්.එල්.එෆ්.ආර්.එස්. (SLFRS)හාඑල්.කේ.ඒ.එස්. (LKAS) (මින් ඉදිරියට එස්.එම්.ඊ. (SME)සඳහා එස්.එල්.එෆ්.ආර්.එස්. (SLFRS)ලෙස දක්වනු ලැබේ.)අනුවපිළියෙලකරඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව සිදුකර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන, පසුගිය එක් වර්ෂයකට (2017 ට) පමණක් අදාලව සංසන්දනාත්මක තොරතුරු ඇතුලත්කර ඇත. මෙම සංක්‍රාන්තියේදී ආයතනය විසින් සාධාරණ අගය හෝ ප්‍රත්‍යාගණිත අගය, කල්පිත පිරිවැයක් ලෙස ඇතුලත් කිරීමක් හෝ කල්පිත පිරිවැයක් සේ ලියාඇරීමක් සිදුකර නොමැත.
ආයතනය විසින් එහි ආරම්භක එස්.එල්.එෆ්.ආර්.එස්. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්තීන් බලපවත්නා තෙක් අඛණ්ඩව එම ප්‍රතිපත්තීන් අනුගමනය කරන අතර පෙර වර්ෂයන්හි ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ආශ්‍රයෙන් 2017 අප්‍රේල් 01දින සිට මූල්‍ය තත්වය ඉදිරිපත් කරනු ලැබේ.

2.3 වැදගත් ගිණුම්කරණ තීරණයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම, ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම්, සහ පවත්නා හෙලිදරව් කිරීම් සහ අසම්භව්‍ය බැරකම් වල හෙලිදරව් කිරීම් හි වාර්තාගත වටිනාකම් වලට බලපාන, තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පනයන් සකස් කිරීම සඳහා කළමනාකාරීත්වයට අවශ්‍ය වේ. මෙම උපකල්පන වල සහ ඇස්තමේන්තු වල අස්ථීරභාවය අනාගතයේදී

වත්කමක හෝ බැරකමක ධාරණ අගයෙහි වැදගත් වෙනස්වීමක් සඳහා බලපානු ඇත.

තීරණයන්

සමාගම් ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ ක්‍රියාවලියේදී කළමණාකරණය විසින්, මූල්‍ය වාර්තා තුලින් හඳුනාගත හැකි, වටිනාකම් මත වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇති කරන පහත සඳහන් තීරණයන් ගෙන ඇත.

අ.) දේපල වර්ගීකරණය

